# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 2022 අංක 35 දරන පළාත්බඳ මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 2022 නොවැම්බර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී


2022 නොවැම්බර් මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 10.00 තැපැල් ගාස්තුව **:** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2022 අංක 35 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2022 නොවැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 62/2021

**1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** (1) මේ පනත 2022 අංක 35 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

(2) මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

**2.** 1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 5අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 1990 අංක 19 දරන පනතේ 5අ වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ "යම් දිසා අධිකරණයක් හෝ පවුල් අධිකරණයක්" යන වචන වෙනුවට "යම් දිසා අධිකරණයක්, පවුල් අධිකරණයක් හෝ සුළු හිමිකම් අධිකරණයක්" යන වචන ආදේශ කිරීමෙන් සහ "යම් දිසා අධිකරණයක් හෝ පවුල් අධිකරණයක්" යන වචන වෙනුවට "යම් දිසා අධිකරණයක්, පවුල් අධිකරණයක් හෝ සුළු හිමිකම් අධිකරණයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "දිසා අධිකරණයක හෝ පවුල් අධිකරණයක" යන වචන සඳහන් වන කවර වූ තැනක "දිසා අධිකරණයක, පවුල් අධිකරණයක හෝ සුළු හිමිකම් අධිකරණයක" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ පැති සටහනෙහි "දිසා අධිකරණවලින් සහ පවුල් අධිකරණවලින්" යන වචන වෙනුවට "දිසා අධිකරණවලින්, පවුල් අධිකරණවලින් සහ සුළු හිමිකම් අධිකරණවලින්" යන වචන ආදේශ කිරීමෙන්.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.